2016 මාර්තු 29 දිනැති මෙහි ඉංග්‍රීසි පිටපත මත මෙම පරිවර්තිත ව.ද.ප පාදක වේ.

ADB ආසියානු සංවර්ධන බැංකුව

# ශ්‍රී ලංකාව: මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- (ණය අදියර 3)

| | |
|---|---|
| ව්‍යාපෘති නාමය | මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- (ණය අදියර 3) |
| ව්‍යාපෘති අංකය | 45148-008 |
| රට | ශ්‍රී ලංකාව |
| ව්‍යාපෘති තත්වය | අනුමැතිය ලැබී ඇත |
| ව්‍යාපෘති වර්ගය/ සහායේ ප්‍රකාරතාව | ණය |
| අරමුදල් මූලාශ්‍රය / වටිනාකම | **ණය 3348-SRI: මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- (ණය අදියර 3)**<br>සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් — ඇ.එ.ජ ඩොලර් මිලියන 123.00<br>**ණය 3349-SRI: මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- (ණය අදියර 3)**<br>ආසියානු සංවර්ධන අරමුදල — ඇ.එ.ජ ඩොලර් මිලියන 5.00<br>**ණය: මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන- (ව්‍යාපෘති 3)**<br>යුරෝපා ආයෝජන බැංකුව — ඇ.එ.ජ ඩොලර් මිලියන 50.00 |
| ක්‍රමෝපාය න්‍යාය පත්‍ර | පාරිසරික වශයෙන් ධරණීය වර්ධනය<br>සමස්ත ආර්ථික වර්ධනය |
| වෙනස්වීමේ තීරක | පරිපාලන සහ ධාරිතා සංවර්ධනය<br>දැනුම් මූල විසඳුම්<br>හවුල්කාරිත්වය<br>පුද්ගලික අංශ සංවර්ධනය |
| ක්ෂේත්‍රය / අනුක්ෂේත්‍රය | **ජල සහ වෙනත් නාගරික යටිතල පහසුකම් සහ සේවාවන්** – නාගරික සනීපාරක්ෂාව – නාගරික මළාපවහනය – නාගරික ජල සැපයුම |

| | |
|---|---|
| ස්ත්‍රී/පුරුෂ සමානතාවය සහ මුක්‍යධාරාව | ඵලදායී ලිංග මුක්‍යධාරාව |
| විස්තරය | ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය ප්‍රධාන වාණිජ අගනගරය වන කොළඹ සහ ඒ අවට ජල සහ අපජල කළමනාකරණ සේවාව වැඩිදියුණු කිරීමට එක්ව කටයුතු කරයි. මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (ණය අදියර 3) මගින් කොළඹ නගරය තුළ ජල සැපයුමේ සහ අපජල සේවාවේ කාර්යක්ෂමතාවය සහ මූල්‍ය ශක්‍යතාවය වැඩිදියුණු කරයි. නගරයේ ජල සැපයුම පුනරුත්ථාපනය කිරීම සහ ගෙවීමකට යටත් නොවී සිදුවන ජලය අපතේ යාම සහ බිල් නොවන බෙදාහැරීමේ ප්‍රමාණය අවම කිරීම මීට අයත්ය. ව්‍යාපෘතිය මගින් නගරයේ අපජල පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල්කිරීම සිදුකරන අතර අපජල කළමනාකරණය සිදුකරයි. මෙම ව්‍යාපෘතිය මගින් පැය 24 පුරා ජලය සැපයීම හරහා ඵලදායී ආර්ථික කටයුතු වලට වැඩි කාලයක් යොමුකල හැකි පරිදි කාන්තාවන් සහ ළමුන් ඇතුළුව දස දහසක් පමණවූ පදිංචිකරුවන්ගේ ජීවිත දියුණු කරයි. |
| ව්‍යාපෘති සාධාරණීකරණය සහ දේශීය/ කාලාපීය ක්‍රමෝපාය කෙරෙහි ඇති සම්බන්ධය | ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ අගනගරය සහ පරිපාලන මූලස්ථානය වන කොළඹ නගරයේ පදිංචි 95% ක් පමණ පිරිස නල ජල සැපයීමේ පද්ධතිය මගින් ආවරණය ලබයි. පද්ධතිය තුළ ජල පීඩනය පහත් මට්ටමක පවතින බැවින් සහ නිතර වෙනස් වනසුළු සහ වරින්වර බණ්ඩනය වෙමින් පවත්නා සැපයුමක් බැවින් නගරයේ ඇතැම් ප්‍රදේශවලට ජලය ලැබෙන්නේ ඉල්ලුම වැඩි වේලාවෙන් පසුවය. එසේම වෙනත් ප්‍රදේශවලට දිනකට සාමාන්‍ය වශයෙන් පැය 6 සිට 10 ක් පමණි. බෙදාහැරීමේ ජාලයේ බොහෝ කොටස් සවිකර ඇත්තේ වසර 100 කටත් පෙරය. පද්ධතියේ ජලයෙන් අඩක් පමණ පද්ධතිය නඩත්තුව සඳහා ආදායම් ඉපැයීමකින් තොරව අපතේ යයි. කොළඹ ජනගහනයෙන් 60% ක් පමණ අඩු ගුණත්වයෙන් යුතු සහ නිතර අවහිරවන මළාපවහන පද්ධතිය සමඟ සම්බන්ධිතය. පොම්පකිරීම් පහසුකම් වලින් තුනෙන් එකක් පමණ ක්‍රියානොකරන අතර එය පිටාර ගැලීමට හේතු වේ. දැනට, අපජලය කිසිදු සත්කාරයකින් තොරව මුහුදට මුදා හැරේ. |
| බලපෑම | 2010-2020 නව ශ්‍රී ලංකා දැක්මට අනුව යමින් මහ කොළඹ තුළ වැඩිදියුණු කරන ලද ජල සැපයුම් සහ අපජල කළමනාකරණ සේවාව සහ කළමනාකරණය |

**ව්‍යාපෘති ප්‍රතිඵල**

| | |
|---|---|
| ප්‍රතිඵල පිළිබඳ විස්තරය | කොළඹ නගරය තුළ ජල සම්ප්‍රාදනයේ සහ අපජල සේවාවේ වැඩිදියුණු කරන ලද පද්ධති කාර්යක්ෂමතාවය සහ මූල්‍යමය වශයෙන් දැරිය හැකි බව |
| ප්‍රතිඵල දෙසටවූ ප්‍රගතිය | |

**ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**

| | |
|---|---|
| ව්‍යාපෘති ප්‍රතිඵල පිළිබඳ විස්තරය | පුනරුත්ථාපනය සහ පුළුල් කළ ජල සැපයුම් පද්ධතිය , සහ කොළඹ නගරයේ ඊසානදිග කලාපය තුළ අඩුකරන ලද ආදායම් නොලබන ජලය. (ව්‍යාපෘති 1 සඳහා ආධාර සහ මූල්‍යන හිදැස ඇතුළුව)<br>පුනරුත්ථාපනය සහ පුළුල් කළ ජල සැපයුම් පද්ධතිය , සහ කොළඹ නගරයේ නිරිතදිග කලාපය තුළ අඩුකරන ලද ආදායම් නොලබන ජලය. (ව්‍යාපෘති 2 සඳහා ආධාර සහ මූල්‍යන හිදැස ඇතුළුව)<br>කොළඹ දකුණු ජලධාරක ප්‍රදේශය තුළ පුනරුත්ථාපනය සහ පුළුල් කරන ලද අපජල පද්ධතිය.<br>කොළඹ දකුණු ජලධාරක ප්‍රදේශය තුළ ගොඩනගන ලද අපජල සත්කාරක කර්මාන්ත ශාලාව.<br>ශක්තිමත් කරන ලද ආයතනික ආකෘතිය සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය. |

| | |
|---|---|
| ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තත්වයන් (ප්‍රතිඵල, ක්‍රියාකාරකම් සහ කරුණු) | |
| භූගෝලීය පිහිටීම | |

**ආරක්ෂණ වර්ගීකරණයන්**

| | |
|---|---|
| පරිසරය | B |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | B |
| ආදිවාසී ජනතාව | C |

**පාරිසරික සහ සාමාජයීය අංග පිළිබඳ සාරාංශය**

| | |
|---|---|
| පාරිසරික අංගය | තෙවැනි ණය අදියර තුළ පරිසරය සඳහා B බාණ්ඩය ලෙස වර්ගකර ඇත. ප්‍රතිඵල 1 සහ 2 සඳහා ව්‍යාපෘති සැකසුම් අදියරයේදී පිළියෙළකරන ලද 'මූලික පාරිසරික විමර්ෂණ කෙටුම්පත' විස්තරාත්මක සැලසුම් අදාල කරමින් යාවත්කාලීන කරනු ඇත. එසේම එය සිවිල් කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව සමාලෝචනයට සහ ප්‍රසිද්ධ කිරීමට ආසියානු සංවර්ධන බැංකුවට භාරදෙනු ඇත. අමතර මූල්‍යකරණය හේතුවෙන් වියහැකි පාරිසරික බලපෑම අදාල වැඩ බිමට විශේෂිත, කෙටිකාලීන, නොවැදගත් මෙන්ම පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් හදුනාගත් ක්‍රියාමාර්ග භාවිතයෙන් මඟහැරිය හැකි සහ/හෝ අවම කල හැකිය. ප්‍රතිඵල 3 සහ 4 සඳහා SPS අනුව මූලික පාරිසරික විමර්ෂණ කෙටුම්පත පිළියෙළ කර ඇති අතර ආයෝජන වැඩසටහන යටතේ පාරිසරික ඇගයීම් සහ විමර්ෂණ ආකෘතිය පිළියෙළ කර ඇත. ඉදිකිරීම් කටයුතු අතරතුර ඍණාත්මක බලපෑම පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් හදුනාගත් ක්‍රියාමාර්ග භාවිතයෙන් අවම කල හැකි පරිදි කෙටිකාලීන, දේශීය, සහ සාපේක්ෂව කුඩා ප්‍රදේශයක වේ. මෙහෙයුම් බලපෑම් නොවැදගත් තරම් වන අතර පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් හදුනාගත් ක්‍රියාමාර්ග භාවිතයෙන් අවම කල හැකිය. එසේම මෙහෙයුම් සහ නඩත්තු අත්පොතක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සකසනු ඇත. වියහැකි බලපෑම් සහ ඒවායේ බලපෑමේ ප්‍රමාණය සැලසුම් කිරීමේදී පාරිසරික සලකාබැලීම් අනුගත කිරීමෙන් දැනටමත් අවම කර ඇත. ව්‍යාපෘති කළමනාකරණය මගින් මූලික පාරිසරික විමර්ෂණ කෙටුම්පත උනන්දුවක් දක්වන පාර්ශව සහ බලපෑමට ලක්වන පුද්ගලයින්ට තේරුම්ගත හැකි භාෂාවෙන් සහ තේරුම්ගත හැකි ආකාරයට හෙළිදරව් කරනු ඇත. සියළුම මූලික පාරිසරික විමර්ෂණ කෙටුම්පත් ලංසු සහ කොන්ත්‍රාත් ලියකියවිලි වල කොටසක් වන අතර ක්‍රියාත්මක කිරීමේදී පරීක්ෂා කරනු ඇත. විස්තරාත්මක සැලසුම් සහ ඉදිකිරීම් අතරතුර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සතුව ඕනෑම පාරිසරික බලපෑමක් කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් තරම් ධාරිතාවයක් තිබෙන බව උපදේශකයින්ගේ සහය සහතික කරයි. පාරිසරික ආරක්ෂණයන් ක්‍රියාත්මකකිරීමේ සහ පරීක්ෂාකිරීම පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුවට අර්ධ-වාර්ෂිකව වාර්තා කරනු ඇත. |
| ස්වේච්ඡා නොවන නැවත පදිංචි කිරීම | ණය අදියර 3 තුළ 'ස්වේච්ඡා නැවත පදිංචිකිරීම්' B බාණ්ඩය ලෙස වර්ග කර ඇත. රජය විසින් බලපෑමට ලක්වූ පුද්ගලයින් උපදේශනය තුළින් කොළඹ නගරයේ දකුණු ජලධාරකය සඳහාවන නැවත පදිංචිකිරීම් සැලැස්මක් පිළියෙල කර භාරදී ඇති අතර එය ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව හෙළිදරව් කර ඇත. සේවා නොලබන ප්‍රදේශ තුළ නව පොම්පකිරීමේ ස්ථාන සහ මළාපවහන පද්ධතිය ඉදිකිරීම හේතුවෙන් වියහැකි ස්ථිර බලපෑම් සහ තාවකාලික බලපෑම් යන ද්විත්වයම කෙරෙහි 'නැවත පදිංචිකිරීම් සැලැස්ම' අවධානය |

| | |
|---|---|
| | යොමුකර ඇත. සමස්තයක් ලෙස රජය සතු ඉඩම් තුළ වාසය කරන බලපෑමට ලක්වූ පවුල් 11 කට (බලපෑමට ලක්වූ පුද්ගලයින් 38) ඔවුන්ගේ නිවාස සහ බදුනිවාස සඳහා ප්‍රවේශය අහිමි වෙයි. දකුණු කොළඹ ප්‍රදේශයේ ආසන්න වශයෙන් 155 ක් පමණවූ ජංගම වෙළෙන්දන් සහ තොරොම්බන්කරුවන් කෙරෙහි දින 7 කට වඩා අඩු කාලයක් තුළ සිදුවන තාවකාලික බාධා කිරීම් ඇතුලත්ව, සේවාව නොලබන ප්‍රදේශ තුළ රේඛීය නල ඉදිකිරීම් කාලය තුළ තාවකාලික ආදායම් අහිමිවීම් අපේක්ෂා කරයි. නේවාසික ප්‍රදේශ තුළ සමස්තයක් වශයෙන් මාර්ගය වසා දැමීමක් බලාපොරොත්තුවන්නේ මීටර් තුනකට අඩු පරාසයකය. එවන් ප්‍රදේශ තුළ ප්‍රවේශ බාධාවන් මඟහැරීමට රාත්‍රි කාලයේදී අදාල ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙනු ඇත. අවසාන සැලැස්ම මත නැවත පදිංචි කිරීමේ සැලැස්ම යාවත්කාලීන කරනු ඇත. කොළඹ මහනගර සභාව මෙයට පෙරද ආසියානු සංවර්ධන බැංකුවේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙන අතර ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂිත ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත්ය. නැවත පදිංචි කිරීම් කළමනාකරණය කිරීමේ සහ පරීක්ෂා කිරීමට සහය දැක්වීමට අමතරව තෙවැනි ව්‍යාපෘතියෙන් පැනනගින සමාජ ගැටළු කෙරෙහි කටයුතු කිරීම සඳහා උපදේශකයින් සහය දක්වයි. ආයෝජන වැඩසටහන සඳහා පිළියෙල කල නැවත පදිංචි කිරීමේ ආකෘතිය සමාජ සුරක්ෂිතතා සම්බන්ධ අපේක්ෂිත බලපෑම් කෙරෙහි මඟපෙන්වීමට භාවිතා කරනු ඇත. පළමු ව්‍යාපෘතිය යටතේ අමතර මූල්‍ය ආයෝජන ඇතුළත් කිරීමට පළමු ව්‍යාපෘතිය සඳහා නැවත පදිංචි කිරීමේ සැලැස්ම යාවත්කාලීන කරනු ඇත. |
| ආදිවාසී ජනතාව | ණය අදියර 3 ‘ආදිවාසී ජනතාව’ C භාණ්ඩය ලෙස වර්කර ඇත. යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළ නාගරික සැකැස්ම සලකා බැලීමෙන් පසුව ආදිවාසී ජනතාව මත කිසිදු බලපෑමක් සිදුවන බව හඳුනානොගනී. එබැවින් ආදිවාසී ජනතා සැලැස්මක් පිළියෙල කර නොමැත. |
| **පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය, සහභාගිත්වය සහ උපදේශනය** | |
| ව්‍යාපෘති සැලසුම්කරණ කාලය අතරතුර | මූලික පාරිසරික විමර්ෂණ සහ නැවත පදිංචි කිරීමේ ලියකියවිලි සකස් කිරීම අතරතුර උපදේශනයන් පවත්වනු ලැබීය. |
| ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම අතරතුර | ව්‍යාපෘතිය විසින් රාජ්‍ය නොවන සංවිධාන බඳවාගනු ඇත. ක්‍රියාත්මක කිරීම අතරතුර තවදුරටත් ඇල්මැති පාර්ශව සංනිවේදනය, සහභාගීත්වය සහ උපදේශණය කරනු ඇත. |

**ව්‍යාපාරික අවස්ථාවන්**

| | |
|---|---|
| උපදේශණ සේවාවන් | උපදේශකයින් යෙදවීම සඳහාවන ආසියානු සංවර්ධන බැංකුවේ මඟපෙන්වීම අනුව සියළුම උපදේශකයින් බඳවා ගනු ඇත (2013, කලින් කලට සංශෝධනය කල පරිදි). තෙවැනි ව්‍යාපෘතිය යටතේ සමස්ත උපදේශණ යෙදවුම් පුද්ගල මාස 1131 ක් බව ඇස්තමේන්තු කර ඇත (අන්තර්ජාතික 5, සහ දේශීය 1126) |
| ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදනය සඳහාවන ආසියානු සංවර්ධන බැංකුවේ මඟපෙන්වීම අනුව සියළුම භාණ්ඩ සහ වැඩකටයුතු ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙනු ඇත (2015, කලින් කලට සංශෝධනය කල පරිදි). තෙවැනි ව්‍යාපෘතිය සඳහා උපදේශකයින්ගේ සහය ඇතිව ක්‍රියාත්මක කිරීමේ ආයතනය සහ ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය ලංසු ලියකියවිලි සකසනු ඇත. |

**වගකිව යුතු නිළධාරී**

| | |
|---|---|
| ආ.ස.බැ වගකිව යුතු නිළධාරී | මින්ග්යුහැන් ෆැන් |
| ආ.ස.බැ වගකිව යුතු දෙපාර්තමේන්තුව | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ආ.ස.බැ වගකිව යුතු අංශය | නාගරික සංවර්ධන සහ ජලය අංශය, දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ක්‍රියාවට නැන්වීමේ නියෝජිත ආයතන | **පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය - අනුපිටපත**<br>අනුපිටපත - කරුණාකර භාවිතකරන්න (SRI0562)<br>330, යූනියන් පෙදෙස, කොළඹ 2<br>ශ්‍රී ලංකාව<br>**නාගරික සංවර්ධන අමාත්‍යාංශය, ජල සම්ප්‍රාදන සහ ජලාපවහන**<br>INFO@WATERMIN.GOV.LK<br>"ලක්දිය මැදුර", නො. 35, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත |

**කාලසටහන**

| | |
|---|---|
| සංකල්ප අනුමත කිරීම | - |
| තොරතුරු සෙවීම | - |
| කළමණාකරණ සමලෝචන රැස්වීම | 2015 අගෝස්තු 12 |
| අනුමැතිය | 2015 දෙසැම්බර් 08 |
| අවසන් විමර්ශණ මෙහෙවර | - |
| ව්‍යාපෘති දත්ත පත්‍රය අවසන් වරට යාවත්කාළීන කරන ලද්දේ | 2016 මාර්තු 21 |

ණය 3348-SRI

**ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන**

| **අනුමැතිය** | **අත්සන් කල දිනය** | **බලාත්මක දිනය** | **නිම කිරීම** | | |
|---|---|---|---|---|---|
| | | | **ප්‍රථම** | **සංශෝධනය** | **සැබෑ** |
| 2015 දෙසැම්බර් 08 | - | - | 2020 දෙසැම්බර් 31 | - | - |

| **මූල්‍ය සැලැස්ම** | | **ණය භාවිතය** | | | |
|---|---|---|---|---|---|
| | සමස්ත අගය ( ඇ.එ.ජ ඩොලර් මිලියන ) | දිනය | ආ.ස.බැ | වෙනත් | ශුද්ධ අගය |
| ව්‍යාපෘති පිරිවැය | 173.02 | සමුච්චිත ගිවිසුම් ප්‍රදානය | | | |
| ආසියානු සංවර්ධන අරමුදල | 123.00 | 2015 දෙසැම්බර් 08 | 0.00 | 0.00 | 0% |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රතිරූප අරමුදල් | 50.02 | සමුච්චිත ණය මුදාහැරීම් | | | |
| සහය මූල්‍යකරණය | 0.00 | 2015 දෙසැම්බර් 08 | 0.00 | 0.00 | 0% |

ණය 3349-SRI

**ඉතා වැදගත් අවස්ථාවන් / සන්ධිස්ථාන**

| අනුමැතිය | අත්සන් කල දිනය | බලාත්මක දිනය | නිම කිරීම | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රථම | සංශෝධනය | සැබෑ |
| 2015 දෙසැම්බර් 08 | - | - | 2020 දෙසැම්බර් 31 | - | - |

| මූල්‍ය සැලැස්ම | | ණය භාවිතය | | | |
|---|---|---|---|---|---|
| | සමස්ත අගය ( ඇ.එ.ජ ඩොලර් මිලියන ) | දිනය | ආ.ස.බැ | වෙනත් | ශුද්ධ අනුපාතය |
| ව්‍යාපෘති පිරිවැය | 5.00 | **සමුච්චිත ගිවිසුම් පිරිනැමීම්** | | | |
| ආසියානු සංවර්ධන අරමුදල | 5.00 | 2015 දෙසැම්බර් 08 | 0.00 | 0.00 | 0% |
| ප්‍රතිරූප අරමුදල් | 0.00 | **සමුච්චිත වියපැහැදිම් ගෙවීම** | | | |
| සහය මූල්‍යකරණය | 0.00 | 2015 දෙසැම්බර් 08 | 0.00 | 0.00 | 0% |

ව්‍යාපෘති සහ වැඩසටහන් සම්බන්ධ සාරාංශගත කරන ලද තොරතුරු ව්‍යාපෘති දත්ත පත්‍රවල අඩංගු වේ. ව්‍යාපෘති දත්ත පත්‍රිකාවක් යනු වැඩ කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ වාර්තාවක් බැවින් ඇතැම් තොරතුරු මෙහි පළමු පිටපත් වල ඇතුළත් නොවිය හැකි අතර එකී තොරතුරු ලැබෙන පරිදි ඇතුලත් කරනු ඇත. යෝජිත ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු තාවකාලික සහ හඟවන තොරතුරු වේ.

ආසියානු සංවර්ධන බැංකුව විසින් මෙම ව්‍යාපෘති දත්ත පත්‍රයේ සඳහන් තොරතුරු එය භාවිත කරන්නන් සඳහා උපකරණයක් ලෙස භාවිතා කිරීමට කිසිදු සහතිකවීමක් නොමැතිව සපයයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ඉහළ ගුණාත්වයෙන් යුත් අන්තර්ගතයක් සැපයීමට සෑම විටම උත්සහ කරන අතර කිසිදු ආකාරයක වගකීමක් නොමැතිව, ප්‍රකාශිතව හෝ හැඟවීමෙන්, පණ්‍යයීය ආකාරයේ වගකීම් සීමාකම් නොමැතිවීම ඇතුළත්ව, නිශ්චිත අරමුණක් සඳහා ගැළපෙන පරිදි, උල්ලංඝනය නොවන ලෙස තොරතුරු "පෙනෙන පරිදි" සපයයි. මෙවන් ඕනෑම තොරතුරුහි නිරවද්‍යතාවය හෝ පරිපූර්ණත්වය පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව විසින් විශේෂිතව ඕනෑම වගකීමක් සහ පෙනීසිටීමක් සිදුනොකරයි.